# සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලිය 2023

## සාහිත්‍ය දැනුම මිනුම

## පාසල් මට්ටම

7 ශ්‍රේණිය — කාලය පැය එකයි

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන වගුව පෙළ පොත ඇසුරින් සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | පාඩම | කවුරුන් විසින් කියන ලද්දක් ද? | කාහට කියන ලද්දක් ද? |
|---|---|---|---|
| (i) "ඔබ මා එතැනට කැඳවා ගෙන ගොස් පැන දුවාවි" | ගොවි බිරියගේ නුවණ | ව්‍යාඝ්‍රයා | හිවලා |
| (ii) "ආ..... මට ඒක කියල දෙන්න බැරි වුණා" | ඔයි රයිරේ ඔයිරාමා | අයියා | මල්ලී |
| (iii) "මං ලොකු වුණාම ටිකට් විකුණන කෙනෙක් වෙන්න ඕනා" | කතා බහට සංයමයක් | ටොව්වේ චං | ටිකට් එකතු කරන්නා |
| (iv) "මට මලය රටින් ලැබුණෙකි. මේ ප්‍රණීත මාංසයෙකි." | සතුරු - මිතුරුව | මේඝවර්ණ | රජු |
| (v) "අනේ! ආයුබෝවන්ට මම ඒ දෙපොළ ම සොයන්නට ගියෙමි" | රාසිං දෙවියන්ට බැණ වැදුණ... | මුරකරු | රජ |

(02) පෙළ පොතෙන් උපුටා ගෙන ඇති පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.

i. මල් රොනට බමරු වඩිනා
   ................................................
   ඇල් පවන ගිමන නිවනා
   ................................................

ii. ..........................................................................................
   ළිඳේ පණිඳාය වැටුණොත් — වනසාය
   ..........................................................................................
   මරණ තුනක් ඇති මිනිහෙක් — පැණිකෑය

iii. නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ — ගෙඩි
   පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් — කෙඩි
   ......................................................................................
   ......................................................................................

iv. ......................................................................................
   ......................................................................................
   ඒ මෙනවට ගෙනා — ගොනා
   කොළ මඩනට ගෙනා — ගොනා

v. ..........................................................................................
   තවුසෙකි සිසිල් ගුණයෙන් හද සුවඳ — කළ
   කුමරෙකි කිතු සසුන් රජ ගෙහි ලත් — කිරුළ
   ..........................................................................................

(03) පහත සඳහන් සඳහන් ප්‍රකාශ හරි නම් √ ලකුණ ද, වැරදි නම් X ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

i. ජනශ්‍රැති විද්‍යාව සම්බන්ධ චරිතයක් ලෙස නන්දසේන රත්නපාල හැඳින් වේ. ( )
ii. අභිකුණ්ඨික ජනතාව විසින් සර්ප විෂ උරා ගැනීමට ගල් විශේෂයක් භාවිත කෙරිණි. ( )
iii. වැලිවිට සඟරජ හිමි උපත ලද්දේ රාජසිංහ රජ සමයේ ය. ( )
iv. ප්‍රබන්ධෝපදේශ නම් කෘතිය මුනිදාස කුමාරතුංගයන්ගේ නිර්මාණයකි. ( )
v. මග දිගට ජනකතා ඒ.පී.ගුණරත්නයන්ගේ කෘතියකි. ( )

(04) පහත දැක්වෙන ඡේදය කියවා ලිහිල් බසින් ලියන්න.

උදක රාක්‍ෂසයා ද ඒ වඳුරන් දියට නො බස්නාවුන් දැක නිල් වූ බඩ හා ධවල වූ මුඛ ඇතිව රත් වූ අතුල් තල, පතුල් තල අතිව භයංකර වේශයෙන් දිය දෙබෑ කොට නික්ම "කුමක් නිසා වුනු ද? පොකුණට බැස පැන් බොව" යි කීය.

(05) පහත සඳහන් පදවල අරුත් ලියන්න.

i. ප්‍රතිඥාව - ........................
ii. ගිරි ශිකර- ........................
iii. කෙමෙන් - ........................
iv. මිගිඳා - ........................
v. පුන්කුඹු - ........................
vi. පිවිතුරු - ........................
vii. තහංචි - ........................
viii. වුවන - ........................
ix. පුනර්ජීවය - ........................
x. ප්‍රකට - ........................